VERITÉ RESEARCH

NO. 5 POLICE PARK PLACE, COLOMBO 00500, SRI LANKA

TEL: + 94 718 834945; FAX: +94 719379567


EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

# ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික රාමුව කාන්තාවන්ට හිතකාමිද?

සිංගප්පූරුවේ හිටපු අගමැති "ලී ක්වාන් යූ" ඉතා මතභේදාත්මක චරිතයකි. සිංගප්පූරුව අත්පත් කරගන්නා ලද සීඝ්‍ර ආර්ථික දියුණුවෙහි පුරෝගාමියා ලෙස ඔහුව සළකනු ලබයි. එමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී නොවන උපක්‍රම යොදාගනිමින් ඔහුගේ ඡන්ද පදනම දීර්ඝ කාලීනව රැකගැනීම සම්බන්ධවද විවේචනයන්ට භාජනය වී ඇත. ශ්‍රී ලංකාව සිංගප්පූරු ආදර්ශය ඉතා ඉහළින් කථා කරන වාතාවරණයක් තුළ එහි පවතින සාධනීය ලක්‍ෂණ උකහා ගැනීම තුළින් ආර්ථික හා සාමාජීය ලෙස තිරසාර වර්ධනයක් ළඟා කර ගත හැකි අංශ කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම ඉතා කාලෝචිත ක්‍රියාවකි.

"ලී ක්වාන් යූ" විසින් ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති අතර සිංගප්පූරුවේ පොදු ප්‍රවාහන සේවාවන් හා මංමාවත් කාන්තාවන්ට නිදහසේ ගැවසිය හැකි සුරක්‍ෂිත පරිසරයක් බවට පත්කිරීම සඳහා ප්‍රමුඛස්ථානයක් හිමි විය. රටක ආර්ථික අභිවෘද්ධිය සඳහා කාන්තාවන්ගේ දායකත්වයෙහි වටිනාකම අවබෝධ කරගත් "ලී ක්වාන් යූ" ආර්ථිකයෙහි විවිධ අංශයන්හි කාන්තා දායකත්වය වැඩිකර ගැනීම සඳහා යෝග්‍ය ආරක්ෂිත පරිසරයක් ඇති කිරීමට අවශ්‍ය පියවර රැසක් ගන්නා ලදි. මෙමගින් ශ්‍රී ලංකාවට ලබාගත හැකි ආදර්ශයන් බොහෝය. මෙවැනි යෝග්‍ය පරිසරයක් ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ සිදුවිය යුතු වෙනස්කම් රාශියකි. එහෙත් වර්තමානයේ ක්‍රියාත්මක වන ආර්ථික පරිසර රාමුව තුළ කාන්තාවන් කොන්වී ඇති බව පෙනේ.

රූප සටහන 01: ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගිත්වය



සිංගප්පූරු ශ්‍රම බලකාය තුළ කාන්තාවන්ගේ ශ්‍රම සහභාගිත්ව අනුපාතය 56.5% කි. ශ්‍රී ලංකා කාන්තාවන්ගේ ශ්‍රම සහභාගිත්ව අනුපාතය 31.2% කි. මෙමගින් සියළු වැඩ කරන වයසේ සිටින ශ්‍රී ලාංකිකයින්ගේ ශ්‍රම දායකත්වය පිළිබඳ අඩු තක්සේරුවකට එළඹිය නොහැක. ඒ මක්නිසාද යත්, ශ්‍රී ලංකා පුරුෂයින්ගේ ශ්‍රම සහභාගිත්ව අනුපාතය 66.2% ක් වැනි ඉහළ අගයක් ගන්නා බැවිනි.

ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත දත්ත විශ්ලේෂණයේදී පෙනී යන්නේ වර්තමානයේ ශ්‍රී ලාංකිකයින් මිලියන 2 ක පමණ ප්‍රමාණයක් විදේශ රැකියාවල නියුතු බවත්, ඉන් 52% ක් වැනි ප්‍රමාණයක් කාන්තාවන් බවත්ය. මින් පැහැදිළි වන්නේ ශ්‍රී ලංකාව තුළ වැඩ කිරීමට කාන්තාවන් දක්වන රුචිකත්වය පිළිබඳ ගැටළුකාරී තත්වයක් ඇති බවයි.


මෙම තෝරා ගැනීම ශ්‍රී ලාංකික කාන්තාවන් සහ පුරුෂයින් ශ්‍රම දායකත්වය සඳහා දක්වන රුචිකත්වය පිළිබඳ යම්කිසි මිණුම් දඬුවක් සපයයි. එනම් සෑම කාන්තාවන් 7 දෙනෙකුගෙන්ම 5ක් ශ්‍රී ලංකාව තුළ වැඩ කිරීමට කැමැත්ත දක්වද්දී දෙදෙනෙකු විදේශ රැකියාවක නියැළීමට කැමැත්ත දක්වන බවයි. පුරුෂයින්ගේ ශ්‍රම සහභාගිත්ව රුචිකත්වය මීට ඉතා වෙනස් විවරණයක් සපයයි. එනම් සෑම පුරුෂයින් 13 දෙනෙකුගෙන්, 11 ක් පමණ ශ්‍රී ලංකාව තුළ රැකියාවක නියැළීමට කැමැත්ත දක්වද්දී දෙදෙනෙකු පමණක් විදේශ රැකියාවක නියුතු වීමට රුචිකත්වය දක්වන බවයි.

මේ අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකික කාන්තවන් විශාල සංඛ්‍යාවක් විදේශ රැකියාවල නියුතු බවත් ඒ සඳහා පුරුෂයින්ට සාපේක්ෂව විශාල රුචිකත්වයක් දක්වන බවත්ය. මෙහිදී අවධානයට භාජනය විය යුතු ප්‍රධාන කරුණ වන්නේ මෙලෙස විදේශ රැකියාවල නියුතු කාන්තාවන්ගෙන් බහුතරය එතරම් ආකර්ෂණීය නොවන ගෘහ සේවිකා රැකියාවල නියැළීමය. එවැනි රැකියාවල පවතින අර්බුදයන් පිළිබඳව දැනුවත් වාතාවරණයක් තුළද විදේශ රැකියා සම්බන්ධව ඉහළ රුචිකත්වයක් දැක්වීමෙන් පෙනී යන්නේ ශ්‍රී ලංකාව තුළ ඔවුනට රැකියා සම්බන්ධව හිමි සමාජ ආර්ථික පසුබිමෙහි අඩුලුහුඩුකම් රාශියක් ඇති බවය. මීට අමතරව ශ්‍රී ලාංකික නීති රාමුව මගින්ම ශ්‍රී ලාංකික කාන්තාවන්ට නිසි ආරක්ෂාවක් සහ රැකවරණයක් ලබාදිය හැකි පනත් ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒම සම්බන්ධව ඉතා පසුගාමී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කරන බවක් දක්නට ලැබේ. උදාහරණයක් ලෙස 2005 දී ගෙන එන ලද ගෘහාශ්‍රිත ප්‍රචණ්ඩත්වය පිටුදැකීමේ පනත ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට තවමත් අපොහොසත් වී ඇති අතර, එය ක්‍රියාත්මක මට්ටමක පැවතියේ නම්, කාන්තාවන්ගේ ආර්ථික ක්‍රියාකාරිත්වය වඩාත් සුරක්ෂිත කිරීමට එමගින් විශාල පිටුවහලක් ලබාදිය හැකිව තිබුණි. මේ සම්බන්ධව ප්‍රතිපත්ති සම්පාදකයින් තවමත් අවබෝධයකින් ක්‍රියා කරන බවක් දක්නට නොමැත.

දත්ත විශ්ලේෂණය මගින් අනාවරණය කර ගත හැකි තවත් පැතිකඩක් ඇත. එනම් දැනට රැකියාවල නියුතු කාන්තාවන්ට රැකියාවල ඉහළ ස්ථරයන්ට ගමන් කිරීමේදී ප්‍රබල ගැටළු වලට මුහුණපෑමට සිදුවන බවයි.

මෙය රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශය තුළද දක්නට ලැබෙන පොදු තත්වයකි. මීට පෙර "වෙරිටේ රිසර්ච්" මගින් සිදුකරන ලද අධ්‍යයනයකදී කාන්තාවන්ට හා සුළු ජාතීන්ට රැකියාවල නියැළීමේදී මුහුණපෑමට සිදුවන අදෘශ්‍යමාන බාධක (Glass Ceiling) පිළිබඳව අධ්‍යයනයක් සිදුකරන ලදි. මෙහිදී අනාවරණය වූයේ රාජ්‍ය අංශය තුළ ඉහළ ස්ථරවල රැකියා මට්ටම් වලට ළඟා වීමේදී පුරුෂ-කාන්තා අනුපාතය (ඉහළම ස්ථරය තුළ) 6:1 වැනි ඉතා ඉහළ පරතරයක් ගන්නා බවත් සමස්ත ආර්ථිකය තුළ මෙය 2:1 ක් වැනි අගයක් ගන්නා බවත්ය. පෞද්ගලික අංශය තුළද මීට සමාන අසමානතාවයන් දක්නට ලැබේ.

අප විසින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව සිදුකරන ලද තවත් අධ්‍යයනයකදී අනාවරණය වූයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළ ගුරු වෘත්තියේ නියුතු කාන්තා ප්‍රතිශතය 70.8% ක් පමණ ඉහළ අගයක් ගත්තද, විදුහල්පතිවරුන් වශයෙන් රැකියාවෙහි නියුතු කාන්තා ප්‍රතිශතය 22% ක් පමණ ඉතා අඩු අගයක් ගන්නා බවය. එනම් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඉහළ තනතුරුවලට ගමන් කිරීම සම්බන්ධව කාන්තාවන් පුරුෂයින්ට සාපේක්ෂව ඉතා පසුගාමී තත්වයක පසුවන බවය. මේ පිළිබඳව කරුණු විමසා බලා නිසි පියවර ගැනීම ඉතා වැදගත් කරුණකි.





ශ්‍රී ලංකික ශ්‍රම බලකාය (එනම් වයස අවුරුදු 10 වඩා වැඩි සේවා නියුක්ත හා සේවා වියුක්ත ජන කොටස) තුළ කාන්තා සහභාගිත්වය සම්බන්ධවද ගැටළු රාශියක් ඇත. ශ්‍රී ලංකික ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගිත්වය 1/3 ක් පමණ වන අතර පුරුෂ සහභාගිත්වය 2/3 කි. එනමුත් කාන්තාවන් අතර සේවා වියුක්ති අනුපාතිකය 6.2% ක් පමණ ඉහළ අගයක් ගනිද්දී පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය

2.8% ක් වැනි ඉතා මට්ටමක පැවතීමෙන් පැහැදිළි වන්නේ කාන්තාවන්ට සාපේක්ෂව පුරුෂයින්ට රැකියාවල නියැළීම සම්බන්ධව පුළුල් ඉඩ ප්‍රස්ථාවන් පවතින බවයි.

මීට අමතරව කාන්තාවන් අතර ඌන සේවා නියුක්තියද පුරුෂයින්ට වඩා ඉහළ අගයක් ගන්නා අතර වැටුප් විෂමතාවයද ඉතා පුළුල්ය. උදාහරණයක් ලෙස අවිධිමත් අංශය තුළ කාන්තාවන්ගේ දෛනික වැටුප පුරුෂයින්ට සාපේක්ෂව 20% කින් පමණ අඩු අගයක් ගනී.

කරුණු මෙසේ වුවද, ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ සාක්ෂරතා මට්ටම හා ද්විතීය අධ්‍යාපනයට අවතීර්ණ වීමේ මට්ටමද පුරුෂයින් හා සමාන තත්වයක පවතින අතර තෘතීය අධ්‍යාපනය සඳහා කාන්තාවන්ගේ සහභාගිත්වය පුරුෂ සහභාගිත්වයද අභිබවන මට්ටමක පවතී. විශ්වවිද්‍යාලවලට 2011 දී තේරී පත්වූ ශිෂ්‍යයින්ගෙන් 58%ක් පමණ කාන්තාවන් විය. එනමුදු ද්විතීය හා තෘතීය අධ්‍යාපනය තුළ විවිධ සාමාජික හා සංස්කෘතික කරුණු සාධක කොට ගනිමින් කාන්තාවන් ඇතැම් අධ්‍යාපනික ක්ෂේත්‍ර තුළ දැඩි ලෙස සංකේන්ද්‍රනය වීමේ ප්‍රවණතාවයක් ද දක්නට ලැබේ. උදාහරණයක් ලෙස විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ කලා අංශයන්හි කාන්තාවන් අති බහුතරයක් අධ්‍යාපන කටයුතු වල නියුතු වේ. බොහෝ විට කලා අංශයෙහි අධ්‍යාපනයෙහි නියැලීම තුළින් ආර්ථිකමය වශයෙන් වඩාත් ඵලදායී රැකියාවල නියැලීමට ඇති අවකාශ අනිකුත් ක්ෂේත්‍රවලට සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පවතියි.

රූප සටහන 02: විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා අවතීර්ණ වීම



**ශ්‍රී ලංකාව කාන්තාවන්ට ප්‍රජාතාන්ත්‍රික රාමුවක් තුළ ලැබිය හැකි ඉහළ ජයග්‍රහණයක් වන ඡන්ද අයිතිය දිනා ගැනීම යන සුවිශේෂී ජයග්‍රහණය 1931 දී සමකාලීන බොහෝ යටත් විජිතයන් අභිබවමින් ලබාගත් රටකි. ශ්‍රී ලංකාව ලෝකයේ පළමු කාන්තා අග්‍රාමාත්‍ය පදවිය ලබාගැනීම සම්බන්ධයෙන්ද සෞඛ්‍ය අධ්‍යාපන ක්‍ෂෙත්‍ර සඳහා කාන්තාවන්ට ලබා දී ඇති පහසුකම් සම්බන්ධවද උදම් අනන රාජ්‍යයකි. එනමුදු ආර්ථික ක්‍රියකාරිත්වය තුළ කාන්තා දායකත්වය පවතින්නේ තවමත් අඩු මට්ටමක වන අතර රැකියාවල ක්‍රියාකාරීව නියුතු වන කාන්තාවන්ට ලැබෙන පහසුකම් සහ ආර්ථික ප්‍රතිලාභ පුරුෂයින්ට සාපේක්‍ෂව අවම මට්ටමක පවතී. එමනිසා ආර්ථික පරිසරය තුළ කාන්තා සහභාගිත්වය දිරිගැන්වීම සඳහා නිසි ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ශ්‍රී ලංකාව තවත් ප්‍රමාද නොවී කටයුතු කළ යුතුය.**

**වෙරිටේ රිසර්ච්** (Verite Research) **යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**